# Living the Lotus 10

## Buddhism in Everyday Life

2026
VOL. 253



සැම මසකම *Living the Lotus* සඟරාව කියවීම ගැන ඔබ සැමට බොහොමත්ම ස්තුතියි. ඔබ සැමගේ සහයෝගය නිසාවෙන් මේ මස සඟරාවේ 21 වන සංවත්සරය සමරනු ලබනවා. මේ සඳහා නන් අයුරින් සහය වූ සැමට හෘදයාංගම ස්තුතිය පුද කරමු.

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ වෙබ් අඩවිය නැවත ප්‍රති නිර්මාණය කිරීමත් සමග, *Living the Lotus* සඟරාව නොවැම්බර් මාසයේ සිට පුවත්පත් ආකෘතියේ සිට වෙබ් සඟරා ආකෘතියක් වෙත මරු කරනු ලබනවා.

*PDF* ආකෘතියෙන් *Living the Lotus* සඟරාව ඔබවෙත එන අවසන් කලාපය මෙය වුවද, නිච්කෝ නිවානෝ තුමාගේ ධර්ම පණිවිඩය සහ එදිනෙද ජීවිතයට බෞද්ධ ඉගැන්වීම් සඟරාව හරහා ඉදිරියටත් ලබාදෙමු.

අප වෙබ් අඩවියේ ඇති *Living the Lotus* පිටුවට පිවිසීමෙන් අඛණ්ඩව කියවීමට හැකිය.



**Living the Lotus**
**Vol. 253 (October 2026)**

Senior Editor: Takashi Maeda
Editor: Sachi Mikawa
Copy Editors: Ruklanthi Palipana, Rajitha Maduranga, Sahan Chamara

published by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124 FAX: +81-3-5341-1224
mail: living.the.lotus.rk-international@kosei-kai.or.jp

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදී නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලොවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.
වර්තමානයේදී නිච්කෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සැම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සැම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life（ioaO¾u mqKavíl iq;%h ;=, Ôj;afjuq - tosfkÞ osúhg nqÿ oyu noaO lr .ksuq'）hk f;audj ;=," tosfkÞ ðù;hg ioaO¾u mqKavíl iq;%fha lshdoSï noaO lr f.k ufvys msfmkakdjq ,iaik fk¨ï u,la fia ;u ðú;h iuDêu;a lrf.k" tf,iu jeä jákdlñka hq;= ;;ajhg m;a úh hq;=h hk m%d¾:kh .eí ù we;' fuu iÕrdj uÕska f,dalh mqrd jHdma; ù isákakdjq idudðl idudðldjka tosfkÞ osúhg nqÿoyu noaO lrf.k lghq;= lrkakdjq whqre wka;¾cd, ud¾.fhka fnÞyeßu isÿ lrkq ,efí'

*President's Message*

# ජීවිතයත්  මරණයත් උතුම් ධර්මයේ කොටසකි ①

නිචිකෝ නිවානෝ තුමා,
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



## ''මරණය'' අභිබවා යාම

බුද්ධ මාර්ගයේ ආධ්‍යාත්මික පුහුණුවෙහි මූලික සහ වැදගත්ම කරුණ වන්නේ ''ඉපදීම, වයසට යාම, රෝගී වීම සහ මරණය යන සතර දුකින් එතෙර වීම'' යන්නයි. මෙය නිර්මාතෘතුමා විසින් , බුදුදහමේ ජීවිතය පිළිබඳ දැක්ම සහ මිනිසාගේ මරණය පිළිබඳ කල දේශනාවක කොටසකි. ''මරණය'' යනු ජීවිතයේ සිදුවන විශාලතම සිදුවීමක් බැවින්, ''මරණයට පත් වූ විට කුමක් වේද'' ''මරණයට බයයි'' ''මරණයට පත් වීමට කැමති නැත'' යන කනස්සල්ල, බිය සහ දුක් වේදනාවන්ගෙන් ''එතෙර වීම'' නොහොත් අභිබවා යාම සැබවින්ම බුද්ධ මාර්ගයේ වැදගත්ම කරුණුවලින් එකක් ලෙස පැවසිය හැක. එසේ කරමින් මානසික සැනසීම ලබාගන්නා අතරම, තමන්ගේ සහ අන් අයගේ සතුට ප්‍රාර්ථනා කරමින් හදවත සහ මනස දියුණු කරගැනීම බුද්ධ මාර්ගයේ ආධ්‍යාත්මික පුහුණුවයි.

එම බුද්ධ මාර්ගයේ වැදගත් කරුණුවලින් එකක් වන ඉපදීම සහ මරණය පිළිගැනීමේ ආකාරය පිළිබඳව, මම මේ දක්වා, නිදසුනක් ලෙස මරණය යනු ''මහා ජීවිතය'' නම් වූ උපන් ගමට නැවත යාමක් ලෙස සලකමින්, ජීවිතය පිළිබඳව, න්‍යායාත්මක භෞතික විද්‍යාඥයෙකු වන හරුඔ සජි මහතාගේ ලේඛණ ආශ්‍රය කරගෙන, අපගේ ජීවිත විශ්වය සමඟ ඒකාබද්ධ වී ඇති බවත් , ''සරලව පැවසුවහොත් සෑම දිනකම සදාකාලිකව ජීවත් වෙමින් සිටිමු'' යන ආකාරයේ  ජීවිත දැක්මක් පැහැදිලි කරමින් පැමිණි-යෙමි.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් සමඟද සම්බන්ධ වන විශ්වීය දෘෂ්ඨිකෝණයකින් ජීවිතය දෙස බැලූ විට , අපි සියලු දෙනාම විශ්වය ආරම්භ වූ කාලයේ සිට අතීතයේ සිට අනාගතය දක්වා අඛණ්ඩව පවතින සදාකාලික ජීවිතයක ජීවත් වෙමින් සිටිමු. එලෙස පිලිගතහොත් , මරණය බියක් බවට පත් නොවන අතර මරණය සම්බන්ධ දුක , කනස්සල්ල සහ කණගාටුව ද සමනය වනු ඇතැයි සිතමි.

සැබෑ ජීවිතයේදී මරණයට මුහුණ දෙමින්, බුදුරජාණන් වහන්සේගේ ජීවිතය සදාකාලික බව දේශනා කරන සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ විශ්වාසය මගින් ජීවිතය සහ මරණය සම්බන්ධ දුක අභිබවා ගිය පුද්ගලයෙකු ලෙස කවියෙකු වූ මියසවා කෙන්ජි සැලකිය හැක. කෙන්ජි විසින් ''මා ඉක්මනින් මරණයට පත්වනු ඇත, අද හෝ හෙට'' ලෙස ආරම්භ කරන කවියක, තම මානසික තත්වය ''මා මරණයට පත් වූ පසු නැවත හිස්බවකට ගමන් කරන්නේද , නැවතත් මා යන හැඟීම ඇති වේද .... එම මූලික ධර්මයෙහි නාමය සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ලෙස නම් කෙරේ'' යනුවෙන් ප්‍රකාශ කර ඇත. මරණයට පත් වූ පසු සසර

නමැති ''මහා ජීවිතයේ'' මූලය වෙත නැවත ගමන් කර පසුව නැවත ඉපදීම සිදු වේ. එය සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය තුළ පෙන්වා දී ඇති බවට ඔහු ප්‍රකාශ කර තිබෙනවා.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හරහා 'සදාකාලික ජීවිතයක' ජීවත් වන තමන් පිළිබඳ අවබෝධ කරගෙන, රෝගයන්හි දුක් කම්කටොළුවලින් මිදුණු කෙන්ජි මහතා තව දුරටත් 'ජීවිතයත් මෙම උතුම් ධර්මතාවයේ ජීවිතයයි , මරණයත් මෙම උතුම් ධර්මතාවයේ මරණයයි' ලෙස ලියා තබා ඇත. එනම්, රෝගයකට ගොදුරු වන ජීවිතය වුවත්, තමන් වෙත ළඟා වන මරණය වුවත්, උතුම් ධර්මයෙහි (විශ්වයේ) ක්‍රියාකාරීත්වය පවතින ආකාරයටම එය පවතින අයුරින්ම පිළිගැනීමට හැකි වන බවයි.

## ''සදාකාලික ජීවිතයක'' ජීවත් වන අප

මියසවා කෙන්ජි විසින් මෙම කවිය (1929 පෙබරවාරි ) රචනා කර ඇත්තේ, එතුමා මිය යාමට වසර 4කට පමණ පෙර වයස අවුරුදු 33 දීය. එතරම් තරුණ වයසකදී මෙවැනි ජීවිතය සහ මරණය පිළිබඳ දෘෂ්ටිකෝණයක් ඇති කරගෙන සිටින පුද්ගලයන් ඉතා දුර්ලභය. නිසැකවම, එහි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයෙහි ඉගැන්වීම් මගින් ලැබුණු සහයක් ඇති බවට සැකයක් නැතැයි සිතමි.

මරණයෙන් පසු තමා කොහේ යන්නේද, කුමක් සිදුවන්නේද යන්න කිසිවෙකු නොදනී. එසේ වුවද, අපි මේ මොහොතේ, මරණයට පත් වූ පසුවද එක දිගටම 'සදාකාලික ජීවිතයක' ජීවත් වෙමින් සිටින බවට ඉගෙනීමට ලැබෙන විට සිතට සැනසීමක් දැනේ. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හමුවී එය වටහාගෙන කෙන්ජි අත්විඳි ප්‍රීතිය, එම ආගමික විශ්වාසයම බෙදාගන්නා අපටත් අතිවිඳිය හැකි ප්‍රීතියක් යැයි කිව නොහැකිද?

මමත් මීට පෙර, 'සාමකාමීව ජීවිතයේ නිජබිම වෙත ආපසු ගමන් කල නිර්මාතෘ තුමාගේ ස්වරූපය දැකගත හැකි වූ නිසා, 'මටත් එ අයුරින් මිය යාමට හැකි වුණි නම් කොතරම් අගනේද 'යන සිතුවිල්ලෙන් , සන්සුන් සිතින් මරණය පිළිගැනීමට හැකි වුණි' යනුවෙන් ප්‍රකාශ කළෙමි. එම හැඟීම අදටත් නොවෙනස්ව පවතී. මෙයත් අපගේ පූර්වගාමීන් විසින් ජීවිතය පිළිබඳ සිදු කල ගැඹුරු අධ්‍යයනයන් සහ උත්සාහයන්ගේ එකතුවක් ලෙසත්, ඇදහිල්ලේ ආශිර්වාදයක් හේතුවෙන් සිදු වූ දෙයක් බව විශ්වාස කරමි.

එසේ වුවද, මරණය යනු තමා හෝ අන් අය ලෙස වෙනසක් නොසලකා සෑම පුද්ගලයෙකු වෙතම පැමිණෙන්නකි. හදවතින්ම එකඟ විය හැකි මරණය කියා දෙයක් නොතිබිය හැක. ඒ නිසාම, 'ඉපදීම,වයසට යාම, රෝගී වීම සහ මරණය යන සතර දුකින් එතෙර වීම' ජීවිතයේ ප්‍රධාන තේමාවක් බවට පත් වේ. තවද, සෑම පුද්ගලයෙකුම මරණයට මුහුණ දෙන නිසාම, මේ මොහොතේ ලැබී ඇති ජීවිතයේ සතුට ගැඹුරින් අගය කරමින්, 'මේ මොහොත' බොහෝ දෙනා සමඟ සාමයෙන්, සුහදව සහ සහයෝගයෙන් ජීවත් වීම අන් සියල්ලටම වඩා උතුම් සතුටක් යැයි පැවසිය හැකිය.

එසේ නම්, විශ්වය ආරම්භ වූ දින සිට අඛණ්ඩව පැවත එන 'සදාකාලික ජීවිතයේ' ප්‍රවාහය තුළ මේ වර්තමාන ජීවිතය පවතින අතර, අපි මේ මොහොතේ 'ඉපදීම, වයසට යාම, රෝගී වීම සහ මරණය' යන දුක් විඳිමින් මේ වර්තමාන ජීවිතය ගත කරන්නේ මන්ද යන කරුණ පිළිබඳව නැවත නැවතත් සිතා බැලීමට කැමතියි.

2026 ඔක්තෝබර් මස 'කෝසෙයි' සඟරාව ඇසුරෙණි



# අවලෝකිතේෂ්වර බෝධිසත්වයන් වහන්සේ ආදර්ශයට ගනිමින්, මෛත්‍රී සහ කරුණා සිතින් වීර්යය වඩමු.

බංගලාදේශ ධර්ම ශාඛාව ප්‍රියා රංජන් බරුවා මහතා

**රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වීමට හේතුව සහ ඒ කවදද?**

මම බෞද්ධ පවුලක ඉපදී හැදී වැඩුණා. මගේ බාප්පලා දෙදෙනෙකු ථේරවාද භික්ෂූන් වහන්සේලා දෙනමක් වූ නිසා, කුඩා කල සිටම මගේ සිතේ බුදුන් වහන්සේ කෙරෙහි දැඩි භක්තියක් තිබුණා. විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් කර බංගලාදේශ රජයේ නිළධාරියෙකු ලෙස, මගේ ගම වූ චිත්තගොං හි සේවය කලා. පසුව ගමේ සිට කිලෝමීටර 400 ක් පමණ දුරින් පිහිටි සිල්හෙට් ප්‍රදේශයට ස්ථාන මාරුවකට පැමිණියා. සිල්හෙට් යනු ඉස්ලාමීය සංස්කෘතිය මුල් බැසගත් නගරයක් වූ නිසාවෙන්, එහි බෞද්ධ විහාරස්ථාන තිබුණේ ඉතාම අඩුවෙන්. එනිසා මට පන්සල් යාමට බුද්ධ වන්දනාවට අවස්ථාව අඩුවී ගියා.

පසුව 2000 අවුරුද්දේ දිනක මගේ මිතුරෙකු වූ බිප්ලොප් බරුවා මහතා සහ ඥාතියෙකු වූ ඔෂිම් බරුවා මහතා හමුවූ අතර, ඔවුන් හරහා චිත්තගොං හි තිබෙන 'රිෂ්ෂෝ කෝසෙයි කායි' නම් ගිහි බෞද්ධ සංවිධානයක් ගැන ප්‍රථම වතාවට දැනගන්න ලැබුණා සහ එවකට එහි ප්‍රධානියා වූ බිමන් කුමාර් බරුවා මහතාවද හඳුන්වා දුන්නා.

ඔවුන් දෙදෙනාගේ උණුසුම් ආරාධනාව පරිදි, මම සේවය කල සිල්හෙට් නගරයේ සිට බොහෝ දුරින් පිහිටි චිත්තගොං වෙන නිතර යමින් සිකුරාද දිනවල පැවැත්වෙන සූත්‍ර සජ්ජායන වැඩසටහන් සහ හෝසා වටයන් සදහා සහභාගී වීමට පටන් ගත්තා.

ථේරවාද බුදු දහම සහ රිෂ්ෂෝ කෝසෙයි කායි තුල එකම බුදුන් වහන්සේගේ ඉගැන්වීම් මූලික කරගෙන කටයුතු කලද, එහි ප්‍රායෝගික භාවිතයේ යම් යම් වෙනස්කම් තිබුණා. ථේරවාද බුදු දහම තුල භික්ෂූන් වහන්සේලා පාලි භාෂාවෙන් සූත්‍ර සජ්ජායනය ධර්ම දේශනා පැවැත්වීම සිදුකරන අතර ශ්‍රාවකයන් පිරිත් සජ්ජායනය, දාන මාන කටයුතු සිදු කිරීම වැනි ආගමික චාරිත්‍ර සිදු කරනවා. පාලි භාෂාව තේරුම් ගැනීමට නොහැකි වීම නිසා බුදු



ප්‍රියා රංජන් බරුවා මහතා

දහමේ ගැඹුරු අර්ථයන් වටහා ගැනීමට නොහැකි අවස්ථාවන්ද තිබෙනවා. නමුත් රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ සාමාජිකයින් එක්ව බෙංගාලි භාෂාවෙන් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර ය සජ්ජායනය කරමින් දහම ගැන එකිනෙකා සමග සාකච්චා කරමින් ඉගෙනගන්නවා.

රිෂ්ෂෝ කෝසෙයි කායි සාමාජිකයින් ගිහි බෞද්ධයන් ලෙස තම පවුලට රැකියාවට මුල් තැන දෙමින් අන් අයගේ සතුට සහ ලෝක සාමය උදෙසා

බුදු දහම ව්‍යාප්තකරමින් බෝධිසත්ව චරිතය ප්‍රායෝගිකව පුහුණු කරන ආකාරය දැක මම පැහැදුණා. එම සංවේදී අත්දැකීම 'මමත් මේ මග යා යුතුයි යන හැඟීමට' පත් කල අතර පසුව මම රිෂ්ෂෝ කෝසෙයි කායි සාමාජිකත්වය ලබා ගත්තා.

**එම පුද්ගලයන් දෙදෙනාගේ හමුවීම ඔයාගේ ආධ්‍යාත්මික ජීවිතයේ වෙනසක් ඇතිකල විශාල සංධිස්ථානයක් වුනා නේද?**

අනිවාර්යයෙන්ම ඔව්. ඔවුන් දෙදෙනා හමු වූ නිසා මට රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය සහ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර ය හමු වූවා. එමෙන්ම ඉගැන්වීම් එදිනෙදා ජීවිතයේ ප්‍රායෝගික පුහුණුව තුලින් මට විශාල මානසික සහනයක් මෙන්ම ආනිශංසද ලැබුණා. සැබැවින්ම ඔවුන්ගේ හමුවීම මගේ ජීවිතයේ නව මාවතක් විවර කල ඉතා වටිනා හමුවීමක් ලෙස මම දකිනවා.



ධර්ම ශාඛාවේ සෑම සිකුරාද දිනකම පවත්වන අනුස්මරණ සූත්‍ර සජ්ජායනයේ නිවේදක කටයුතු සිදු කරන රංජන් බරුවා මහතා

රිෂ්ෂෝ කෝසෙයි කායි එකට පැමිණි මුල් කාලයේ, ජපානයෙන් පැමිණ බංගලාදේශය තුල ධමයේ බීජයන් වැපිරූ ර්සවා කසුමසා මහතාගෙන් වටිනා ධර්ම කරුණු රාශියක් ඉගෙනීමට හැකිවූවා. විශේෂයෙන්ම රිෂ්ෂෝ කෝසෙයි කායි සාමාජිකයින් අන් අයගේ සතුට උදෙසා දිනපතා බෝධිසත්ව ක්‍රියාකාරකම් වල යෙදෙන බව පැවසූ විට ඒ කෙරෙහි මාතුල උනන්දුවක් ඇති වූවා. එතැන් සිට මම, සිකුරාද දිනවල මම සේවය කල සිල්හෙට් සිට චිත්තගොං දක්වා පැමිණ ධර්ම මිතුරන් සමග සූත්‍ර සජ්ජායනයන් සහ හෝසා වලට සහභාගී වූවා. පසුව රිෂ්ෂෝ කෝසෙයි කායි වටිනා ඉගැන්වීම් හැකිතරම් පිරිසකට බෙදදීමේ අරමුණින් සිල්හෙට් වල හිත මිතුරනුත් මේ සඳහා යොමුකල අතර, පවුල් 25 ක් පමණ ධර්ම මාර්ගයට යොමු කිරීමට හැකි වූවා.

**සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් වලින් ඔබේ හදවතට තදින්ම දැනුණු ධර්ම කරුණ කුමක්ද?**

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර යේ මංජුශ්‍රී, මෛත්‍රී, අගර්හිත වැනි බෝධිසත්වයින් කිහිප දෙනෙකුම නිරූපණය වනවා. ඒ සෑම බෝධි සත්වයෙකුටම තමන්ට ආවේනික වූ උතුම් ගුණාංග සහ ක්‍රියාවන් තිබෙන අතර, අප ජීවත් විය යුතු ආකාරය පිළිබද හොදම ආදර්ශය අපට ලබාදෙනවා. මගේ හිතට තදින්ම දැණුනු බෝසත් චරිතය නම් මෛත්‍රීයේ සහ කරුණාවේ සංකේතය බදු වූ අවලෝකිතේෂ්වර බෝදිසත්වයන්ගේ චරිතයයි. මම එම චරිතය කෙරෙහි මහත් ගෞරවයෙන් මගේ ජීවිතයේ ඉලක්කය කර ගත්තා. 25 වන පරිච්චේදයේ අවස්ථා 32 කට වෙනස්වෙමින් ධර්මය දේශනා කල බවට සදහන් වනවා. එහි තේරුම නම්, අවලොකිතේෂ්වර බෝධිසතයන් වහන්සේ මිනිසුන් දුකින් මුදවා ගැනීමට නොයෙක් ස්වරූප මවා ගනිමින් එක් එක් පුද්ගලයාට ගැලපෙන පරිදි කරුණාව දක්වන බවයි. මමත් අවලෝකිතේෂ්වර බෝධි සත්වයන් වහන්සේ මගේ ආදර්ශය කර ගනිමින් කරුණා සිතින් යුතුව දුකෙන් පෙළෙන මිනිසුන්ට හැකි අයුරින් පිහිට වීමට බලපොරොත්තු වනවා.

**කෝසෙයි කායි ඉගැන්වීම් තුලින් හදවතට දැනුණු කාරණය කුමක්ද?**

'පළමුව අන් අය' යන වචන පෙළ මගේ හදවත තදින් ස්පර්ෂ කලා. එය මගේ එදිනෙදා ජීවිතය තුල ප්‍රායෝගිකව පුහුණු කිරීමට උත්සහ කරනවා. මන්ද 'පළමුව අන් අය' යන්න සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ

උගන්වන බෝධිසත්ව ජීවන රටාව වන අතර, ප්‍රායෝගික ක්‍රියාවේ ස්වරූපයයි. තමන් ධර්මාවබෝධය ලබන අතර තුරම අන් අයගේ සතුට උදෙසා ක්‍රියා කරමින් අන් අය සමගම තමන් සතුටුවන පුද්ගලයා බෝධිසත්වවරයෙකු ලෙස අප සංවිධනයේ උගන්වන නිසායි. නමුත් අපගේ වර්තමාන සමාජය දෙස බැලූ විට ආත්මාර්ථකාමී ලෙස සිතා කටයුතු කරන පිරිසගේ අඩුවක් නැත. එය ඉතා කණගාටුදයක තත්වයක් වුවත්, 'පළමුව අන් අය' යන්න සිතේ තබාගෙන අන් අයගේ සතුට ප්‍රර්ථනා කරමින් කටයුතු කිරීම තුලින් ජීවිතයේ සැබෑ සතුට ලබාගතහැකි බව මම විශ්වාස කරනවා.

**රිෂ්ෂෝ කෝසෙයි කායි හි ආකර්ෂණීත්වය ගැන ඔබගේ අදහස් මොනවාද?**

කෝසෙයිකායි හි පුහුණුවීම් අතරින් සූත්‍ර සජ්ජායනය, හෝසා වටය, එක්වරු දනමය පිංකම කෙරෙහි මාතුල ආකර්ෂණයක් තිබෙනවා. ඊට හේතුව සූත්‍ර සජ්ජායනය මගින් බුදුන් වහන්සේට සහ ආදි මුතුන් මිත්තන්ට කෘතවේදී වීමට හැකිවීමත්, හෝසා තුල ධර්මය සාකච්චා කරමින් එකිනෙකාගේ අත්දැකීම් බෙද ගැනීමට හැකිවීමයි. එමෙන්ම එක් වේලක් කැප කිරීම මගින් කුසගින්න අත්විදිමින් ලොව පුරා දිළිදුකමින් පෙළෙන ජනයාගේ සතුට ප්‍රර්ථනා කරමින් මුදල් පරිත්‍යාග කිරීම යනු 'සහකම්පනය, ප්‍රාර්ථනය සහ දනය යන බෞද්ධ ඉගැන්වීම් මතපදනම් වූ බෝසත් චර්යාවේ ප්‍රායෝගික පුහුණුවක් සහ ලෝක සාමය ප්‍රාර්ථනා කිරීමයි.

**අවසාන වශයෙන් ඔබගේ ආධ්‍යාත්මික ගමනේ අනාගත බලාපොරොත්තු මොනවාද?**

අපි දිනපතා සජ්ජායනය කරන සාමාජික අධිෂ්ඨානයේ 'ශ්‍රද්ධාව වර්ධනය කරගනිමින්, පවුලේ, සමාජයේ රට තුල සහ ලෝකයේ සාමය ඇති කිරීම සදහා බෝධිසත්ව චර්යාව ප්‍රගුණ කරමි' යන්න පැහැදිළිව දක්වා තිබෙනවා. එනිසා ඉදිරියටත් වෙනස්වීමකින් තොරව දිනපතා වීර්යය වැඩීමට බලාපොරොත්තු වනවා. අනාගත බලාපොරොත්තුව ලෙස, තව අවුරුදු 3 කින් මම මගේ රැකියාවෙන් විශ්‍රාම ගැනීමට නියමිත අතර, විශ්‍රාම ජීවිතය අලුත් ආරම්භයක් ලෙස ගෙන අන් අයගේ සතුට උදෙසා ධර්ම ව්‍යාතියේ යෙදීමට බෝධිසත්ව චර්යාව ප්‍රගුණ කරමින් අර්ථවත් ජීවිතයක් ගත කිරීමට බලාපොරොත්තු වනවා



බංගලාදේශ ධර්ම ශාඛාවක හෝසා වටයකට සහභාගී වී සිටින රංජන් බරුවා මහතා
(ඉදිරි පස වමේ සිට දෙවැනියා)

# සතර දුකින් එතෙර වන්න,
# මේ මොහොතේ ජීවත් වෙමු

මැඑද තකෙෂි මහතා
රිෂ්ෂෝ කෝසෙයි සංවිධානයේ අන්තර්ජාතික ප්‍රධානී

හැමෝටම ආයුබෝවන්. බුදු දහම තුල මිනිස් ජීවිතයේ ඉපදීම, වයසට යාම, ලෙඩවීම සහ මරණය යන සතර දුක් ගැන උගන්වනවා. එමෙන්ම අප නිර්මාතෘ තුමන්, 'බුද්ධ මාර්ගය ප්‍රගුණ කිරීමේ මූලිකම සහ වැදගත්ම දේ නම්, සතර දුකින් එතෙර වීම' බව උගන්වනවා. එසේනම්, 'එතෙර වීම' යන්නේ තේරුම කුමක්ද? මම සිතන්නේ එය දුක නැති කිරීම නොවේ, සතර දුක් ඇති ජීවිතයක් තුල ජීවත් වන්නේ කෙසේද යන්න තේරුම් ගැනීම සහ එම මාර්ගය සොයා ගැනීමයි.

'ඉපදීමේ දුක' යනු අප සිතන ආකාරයට දේවල් සිදු නොවන ජීවිතයක ගමන් කිරීමයි. නමුත්, අප උපත ලැබූ නිසාම විවිධ පුද්ගලයන් හමු වීමටත් බොහෝ සබඳතා ඇති කරගැනීමටත් හැකිව තිබෙනවා. ජීවත් වනවා කියන්නෙම එවැනි සබඳතා හමුවන ගමනක්මවේ.

'වයසට යාමේ දුක' යනු ශරීරය ක්‍රමයෙන් ක්ෂයවී යාමයි. නමුත් වයසට යාමත් සමග අත්දැකීම් වැඩි වන අතර අන් අයගේ දුක් වේදනාවන් තේරුම් ගැනීමටද හැකිවනවා.

'ලෙඩවීමේ දුක' ඉතාමත් කණගාටු දයක, වේදනාකාරී දෙයක්. කෙසේ වෙතත් රෝගී තත්වයන් ඇතිවන නිසාම, නීරෝගීකමේ අගය මෙන්ම අප වටා සිටින පුද්ගලයන්ගෙන් ලැබෙන සහයෝගය සහ රැකවරණය තේරුම් ගැනීමට අවස්ථාව හිමි වනවා.

අවසානයට 'මියයාමේ දුක'. ජීවිතයේ ඕනෑම කෙනෙකුට අනිවර්යයෙන්ම අවසානයක් තිබෙනවා. එනිසාම යම් දිනෙක මියයන බව දන්නා නිසාම අද මේ මොහොත අගය කරමින් වැදගත් ලෙස ජීවත් වීමට හැකියාව ලැබෙනවා.

අපට සතර දුක් නැති කිරීමට නොහැකියි. නමුත් සතර දුක් හරහා ජීවිතයේ වටිනාකම තේරුම් ගැනීමටත්, අන් අය සමග ඇති සබඳතා අගය කිරීමටත් හැකිව තිබෙනවා. එසේ සිතන කල, සතර දුක් යනු ජීවිතය විනාශ කරන බිත්ති හතරක් නොව ජීවිතය තුල ගැඹුරින් ජීවත් වීමට 'දොරටු හතරක්' විය හැකියි.

සතර දුකින් එතෙර වීම යන්නෙන් අදහස් කරන්නේ දුකෙන් තොර ජීවිතයක් සෙවීම නොව, දුක් කම්කටොළු මැද වුවද එහි අර්ථය සොයා ගනිමින් වර්තමාන මොහොත අගය කොට ජීවත් වීම යැයි මම සිතනවා.




අගෝස්තු මස 12 වන දින ලන්ඩන් ධර්ම ශාඛාවේ සාමාජික මාටින් ටේලර් මහතා සහ ඔහුගේ බිරිඳ ජාත්‍යන්තර මූලස්ථානයට පිළිගත් අවස්ථාව. ටේලර් මහතා ස්කොට්ලන්තයේ වෙසෙන ලොක ප්‍රසිද්ධ ගිටාර් වාදකයෙකු වන අතර, තෝකියෝ හි පැවැත්වෙන ප්‍රසංගයකට ජපානයට පැමිණ තිබේ. (ඉදිරි පෙළ දකුණු කෙළවරේ මැඑද අධ්‍යක්ෂක තුමා)




# A Global Buddhist Movement




**Information about local Dharma centers**

**facebook**

**X**

We welcome comments on our newsletter Living the Lotus: living.the.lotus.rk-international@kosei-kai.or.jp